ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2402/24 - 2024 සැප්තැම්බර් මස 22 වැනි ඉරිදා - 2024.09.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**(40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනත**

16 වන වගන්තිය යටතේ වූ ඇඳිරි නීති නියමය

මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රදේශවල මහජන සාමය පවත්වාගෙන යාමට අවශ්‍ය යැයි මා විසින් සලකනු ලබන හෙයින්, (40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 16 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජනාධිපති රනිල් වික්‍රමසිංහ වන මම, ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය හෝ ලේකම්, මහජන ආරක්ෂක අමාත්‍යාංශය හෝ ඔවුන් විසින් බලය දෙනු ලබන කවර හෝ නිලධාරියකු විසින් ප්‍රදානය කරන ලද ලිඛිත අවසර පත්‍රයක අධිකාරය යටතේ මිස, 2024 සැප්තැම්බර් මස 22 වන දින පැය 06.00 සිට 2024 සැප්තැම්බර් මස 22 වන දින පැය 12.00 දක්වා කිසිම තැනැත්තකු විසින් යම් පොදු මාර්ගයක, දුම්රිය මාර්ගයක, පොදු උද්‍යානයක, පොදු ක්‍රීඩා භූමියක හෝ වෙනත් පොදු භූමියක හෝ එම ප්‍රදේශවල මුහුදු වෙරළේ නොසිටිය යුතු යයි මේ නියමය මගින් විධාන කරමි.

**රනිල් වික්‍රමසිංහ,**
ජනාධිපති.

2024 සැප්තැම්බර් මස 22 වැනි දින,
කොළඹ දී ය.

1A - G 42722 — 365 (2024/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය

කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය හා ඒ දිස්ත්‍රික්කයට යාබද දේශීය ජල තීරය
ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කය හා ඒ දිස්ත්‍රික්කයට යාබද දේශීය ජල තීරය
කළුතර පරිපාලන දිස්ත්‍රික්කය හා ඒ දිස්ත්‍රික්කයට යාබද දේශීය ජල තීරය
මහනුවර පරිපාලන දිස්ත්‍රික්කය
මාතලේ පරිපාලන දිස්ත්‍රික්කය
නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කය
ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කය හා ඒ දිස්ත්‍රික්කයට යාබද දේශීය ජල තීරය
මාතර පරිපාලන දිස්ත්‍රික්කය හා ඒ දිස්ත්‍රික්කයට යාබද දේශීය ජල තීරය
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය හා ඒ දිස්ත්‍රික්කයට යාබද දේශීය ජල තීරය
යාපනය පරිපාලන දිස්ත්‍රික්කය හා ඒ දිස්ත්‍රික්කයට යාබද දේශීය ජල තීරය
කිලිනොච්චිය පරිපාලන දිස්ත්‍රික්කය හා ඒ දිස්ත්‍රික්කයට යාබද දේශීය ජල තීරය
මන්නාරම පරිපාලන දිස්ත්‍රික්කය හා ඒ දිස්ත්‍රික්කයට යාබද දේශීය ජල තීරය
වවුනියාව පරිපාලන දිස්ත්‍රික්කය
මුලතිව් පරිපාලන දිස්ත්‍රික්කය හා ඒ දිස්ත්‍රික්කයට යාබද දේශීය ජල තීරය
මඩකලපුව පරිපාලන දිස්ත්‍රික්කය හා ඒ දිස්ත්‍රික්කයට යාබද දේශීය ජල තීරය
අම්පාර පරිපාලන දිස්ත්‍රික්කය හා ඒ දිස්ත්‍රික්කයට යාබද දේශීය ජල තීරය
ත්‍රිකුණාමලය පරිපාලන දිස්ත්‍රික්කය හා ඒ දිස්ත්‍රික්කයට යාබද දේශීය ජල තීරය
කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කය
පුත්තලම පරිපාලන දිස්ත්‍රික්කය හා ඒ දිස්ත්‍රික්කයට යාබද දේශීය ජල තීරය
අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කය
පොළොන්නරුව පරිපාලන දිස්ත්‍රික්කය
බදුල්ල පරිපාලන දිස්ත්‍රික්කය
මොණරාගල පරිපාලන දිස්ත්‍රික්කය
රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කය
කෑගල්ල පරිපාලන දිස්ත්‍රික්කය

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.